# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
# Department of Animal Production and Health

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General } +94-081-2388195

E-mail : dgdaph@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office } +94 081-2388120
184/189/337/462

Web : www.daph.gov.lk



සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව
ලැබුණේ
19 MAR 2024
ප්‍රධාන කාර්යාලය
පරිපාලන අංශය


DAPH/FD/1/1

2024.03.18

දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 03/2024 - i

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම අධ්‍යක්ෂවරුන්,

සියළුම අංශ ප්‍රධානීන්,

<u>ආදායම් රැස්කිරීම, තැන්පත් කිරීම හා ගිණුම් වාර්තා තබාගැනීම / ඉදිරිපත් කිරීම සහ "ලෙටර් එව්" ගිණුම සකස් කිරීම පිළිබඳ උපදෙස් මාලාව.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ අංක 03/2024 හා 2024.01.30 දිනැති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙන් පහත උපදෙස් මෙයින් නිකුත් කරනු ලැබේ.

02. දෙපාර්තමේන්තුවෙන් සැපයෙන සේවාවන් සඳහා සේවාලාභීන් විසින් දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට සෘජුවම මුදල් තැන්පත් කරනු ලබන අවස්ථාවන්හිදී එම තැන්පතු නිවැරදිව හඳුනාගැනීම, ඒ සඳහා ලදුපත් නිකුත් කිරීම, ඒ සම්බන්ධයෙන් වාර්තා තබාගැනීම පිළිබඳ පහත උපදෙස් අනුගමනය කරන මෙන් දන්වමි.

I. දෙපාර්තමේන්තුවෙන් සැපයෙන සේවාවන් සඳහා සේවාලාභියකු විසින් දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට සෘජුව මුදල් තැන්පත් කිරීමට පෙර එම ගාස්තු ලබා ගැනීමට අදාලව පොදු 118 මුදල් ගෙවීමේ වවුචරයක් අදාල විෂය භාර නිළධාරියා විසින් නිසි පරිදි සම්පූර්ණ කර අත්සන යොදා සේවාලාභියාට ලබා දිය යුතුයි.එම මුදල් ගෙවීමේ වවුචරය සම්පූර්ණ කිරීමේදී අනෙකුත් විස්තරවලට අමතරව ලබාගන්නා සේවාවට අදාලව හඳුන්වා දී ඇති කේත අංකය හා ඊට අදාල විස්තරය පැහැදිලිව සඳහන් කල යුතු අතර සේවාලාභියා විසින් බැංකුවට මුදල් ගෙවීමේදී ද එම සංකේත අංකය බැංකුවට මුදල් ගෙවීමේ ලදුපතේ සටහන් කරන ලෙසත් බැංකුව නිළධාරියා ලවා එම සංකේත අංකය බැංකු ගිණුමේ අනිවාර්යයෙන් සටහන් තබන ලෙසත් සේවා ලාභියාට උපදෙස් ලබා දිය යුතුය,එසේ කේත අංක සටහන් නොකර ඇති කිසිදු තැම්පතුවක් වෙනුවෙන් මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක් (පොදු 172) නිකුත් නොකල යුතුය.

II. මුදල් තැන්පතුව නිවැරදිව දෙපාර්තමේන්තු නිල බැංකු ගිනුමට තැන්පත් වූ බව තහවුරු කරගැනීමෙන් පසු පමණක් පොදු 172 ලදුපත් නිකුත් කළ යුතුයි.

III. ඒකකයට අදාළ ආදායම් වෙනුවෙන් පමණක් ඒම ඒකකය තුළින් ලදුපත් නිකුත් කළ යුතු අතර වෙනත් ඒකකවලට ආදාල ආදායම් සම්බන්ධයෙන් ලදුපත් නිකුත් නොකිරීමට තරයේ වග බලා ගත යුතුය.

IV. කිසිදු අවස්ථාවක එකම තැන්පතුව වෙනුවෙන් ලදුපත් දෙකක් නිකුත් නොවන බවට සහතික වන පරිදි වන වැඩ පිළිවෙළක් සකස්කර ගැනීම ලදුපත් නිකුත් කරනු ලබන නිළධාරියාගේ වගකීම බව අවධාරණය කෙරේ. ඒ සඳහා බැංකු ගිණුමේ තැන්පතුවට ආදාල සටහන ඇති පිටුවේ මුද්‍රිත පිටපතක් ලබාගෙන එම තැන්පතු සටහනට අදාළව නිකුත් කරනු ලබන ලදුපතේ (පොදු 172) හි අංකය, බැංකු ප්‍රකාශයේ සටහන ඉදිරියෙන් සටහන් කර එම පිටපත් නැවත පරික්ෂා කිරීමට හැකිවන පරිදි ගොණු ගත කිරීමට කටයුතු කළ හැකිය.

V. සෘජු තැන්පතු එව් අක්ෂර ගිණුම මගින් වාර්තා කිරීමේදී ඒවා සෘජු තැන්පතු බව එව් අක්ෂර ගිණුමේ සටහන් කළ යුතුයි. එසේම සෘජු තැම්පතුවලට අදාල බැංකු ලදුපතේ පිටපත් අමුණා එවිය යුතු අතර දිනක් තුල බැංකුවට සෘජුව තැම්පත් කල තැන්පත් ලැයිස්තුවක් සමඟ ඒ වෙනුවෙන් පොදු 118 ගෙවීම් වවුචරයක් සම්පූර්ණකර එව් අක්ෂර ගිණුම සමඟ ප්‍රධාන කාර්යාලයට එවීමට කටයුතු කළ යුතුය.

Hemali Abey...

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ.කොතලාවල

අධ්‍යක්ෂ ජනරාල්

Dr. (Mrs.) K.A.C ... alawala
Dir... al
Dept. of Anim... n & Health
P. O. B... ...ibe
Peradeniya